**ශීර්ෂය 319 - සබරගමුව පළාත් සභාව - 2022**
---------------------------------------------------

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සබරගමුව අනභිබවනීයත්වයට.

**1.2 මෙහෙවර**

සබරගමුව ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සියලුම සම්පත් ඵලදායීව හා ගුණාත්මකව කළමනාකරණය කිරීම තුළින් සබරගමුව අභිමානවත් පෙර ගමනකට.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

සබරගමුව පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 35,545.0 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 32,868.4ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 2,677.6 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7.53ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2022 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 33,380.0 | 31,306.8 | 2,073.2 | 6.21 |
| මූලධන | 2,165.0 | 1561.6 | 603.4 | 27.85 |
| එකතුව | 35,545.0 | 32,868.4 | 2,676.6 | 7.53 |

**3. විගණන නිරීක්ෂණය**

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.